**ශීර්ෂය 216 - සමාජසේවා දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**--------------**

1.1 **විගණන මතය**

**---------------**

සමාජසේවා දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාජසේවා දෙපාර්තමේන්තුව මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සමාසේවා දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සමාජසේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**--------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94 සහ 2017 දෙසැම්බර් 27 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක බීඩීසීපීබී/4/1/9-2018 දරන චක්‍රලේඛ 3/2017 ප්‍රකාරව බැදීම් ඇතිකරගැනීමට පෙර ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන තහවුරු කරගත යුතුවේ. කෙසේවුවද, දෙපාර්තමේන්තුව විසින් වැය විෂයයන් 07 ක් ප්‍රතිපාදන ඉක්මවා රු.1,187,076 ක් බැරකම් ඇතිකර ගෙන තිබුණි. | වර්ෂය තුලදීම වියදම්වලට ගෙවීමටත් බැරකම් අවම කර අත්‍යවශ්‍ය වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි සපයා ගැනීමට හා වර්ෂය සඳහා වූ වියදම් වර්ෂය තුළ ගෙවා නිමකිරීමටත් බැරකම් වලට එළඹීමේදී ප්‍රතිපාදන ඉක්මවා නොයන පරිදි සීමා පිළිබඳ සැළකිළිමත් විය යුතු වීම. | සමාජ සේවා දෙපාර්තමේන්තුවේ හා වෘත්තීය පුහුණු ආයතන සඳහා ප්‍රමාණවත් පරිදි ඇස්තමේන්තු සකස් කලද එම ප්‍රතිපාදන එපරිද්දෙන්ම නොලැබුනද අත්‍යවශ්‍ය වියදම් දැරීම සිදු කල යුතුව තිබේ. විශේෂයෙන් ආබාධිත දරුවන් සිටින ආයතන වල අඛණ්ඩව සිදුකල යුතු කාර්යයන් එපරිද්දෙන්ම සිදු නොකලහොත් ආයතන පවත්වා ගෙන යාමේ ගැටළු සහගත තත්ත්වයක්ද පැන නගින හෙයින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට සිදු වූ බව දක්වා තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාත්‍යන්තර සුදු සැරයටි දිනය ත්‍යාග මුදල් ලබාදීම සඳහා සහ සහභාගිත්ව දීමනා වෙනුවෙන් රු.820,000 ක මුදලක් දෙපාර්තමේන්තුව විසින් වියදම් කර තිබුණද, එම කාර්ය. සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | ආයතනයේ වාර්ෂිකව සිදුකරන මෙබඳු මෙහෙයුම් ස්වභාවයේ කාර්යයන් ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කල යුතු වීම. | 216 – 02 – 03 – 1 – 1501 වැය විෂය සුභසාධන කටයුතු වෙනුවෙන් වෙන්වූ වැය විෂය බැවින් වාර්ෂිකව ජාත්‍යන්තර සුදුසැරයටි දිනය වෙනුවෙන් එයට සහභාගිවන දෘශ්‍යාබාධිත අයට ත්‍යාග ලබා දීම මෙම වැය විෂයෙන් සිදු වේ. ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී වර්ෂයෙන් වර්ෂයට ඇතුලත් කල යුතු විෂයන් වෙනස් වන බැවින් හා මෙම 1501 වැය විෂය ප්‍රාග්ධන වැය විෂයක් නොවන බැවින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොමැති බව දක්වා තිබුණි. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | අදහස් දැක්වීම ගනන්දීමේ නිලධාරිගේ |
|---|---|---|---|
| (අ) | ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩ සටහනට ඇතුළත් අරමුණු වලින් පහත සඳහන් අරමුණු ඉටුකර නොතිබුණි. | | |
| | **(i)** ප්‍රජාවේ සියළු ආබාධ සහිත පුද්ගලයන් නිවැරදිව හඳුනා ගැනීම**,**දත්ත පද්ධතියක් ගොඩ නැගීම හා යාවත්කාලීන කිරීම. | ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කර යාවත්කාලීනව පවත්වාගෙන යාමේ වගකීම දෙපාර්තමේන්තුව සතුවන නිසා ඒ සඳහා අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතුවීම. | මේ සම්බන්ධයෙන් සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේද සහභාගීත්වයෙන් 2019 මාර්තු 25 මූලික සාකච්ඡාවක් පවත්වා සමීක්ෂණ පත්‍රිකාවක් සකස් කරනු ලැබීය. කෙසේ වූවත් 2019 වර්ෂයේ අයවැය මඟින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයට උක්ත කටයුත්ත වෙනුවෙන් රු.මි.15 ක් වෙන් වී ඇති බැවින්**,** එම කාර්යාලයේ සමඟ එක් වී මෙම කාර්යය ඉටුකර ගැනීමට කටයුතු කරන බව දක්වා තිබුණි. |
| | **(ii)** ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන සඳහා සම්පත් මධ්‍යස්ථානයක් ඇති කර තිබුණද එම මධ්‍යස්ථානයේ | ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන සඳහා වූ සම්පත් මධ්‍යස්ථාන කඩිනමින් ක්‍රියාත්මක කිරීම තුළින් ආබාධ සහිත තැනැත්තන්ට | මෙම ක්‍රමවේදය ජාතික ප්‍රජා මූලික පුනරුත්ථාපන ක්‍රියාවලියේ මූලික ආරම්භක අවධියයි. ග්‍රාමීය මට්ටමින් හඳුනාගන්නා සෑම ආබාධ සහිත |

| | | | |
|---|---|---|---|
| | වැඩසටහන් 2019 මැයි 31 දින දක්වාම ආරම්භකර නොතිබුණි. | සහන සැළසීමට කටයුතු කිරීම. | පුද්ගලයෙකුටම පුනරුත්ථාපන සැලැස්මක් සකස් කරනු ලබන අතර එහි සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී විද්‍යාත්මක හා තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතා කරමින් පුනරුත්ථාපන කටයුතු කරන බව දක්වා තිබුණි. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොට්ටාව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමට ඉකුත් වර්ෂයේදී රු.මිලියන 25 ක් හා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 05 ක් බැගින් වෙන්කර තිබුණද, ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාදවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට මුළු වියදම රු.12,065,852 ක් වී තිබුණි. කෙසේවුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් ඉදිකිරීම භෞතික ප්‍රගතිය සියයට 50 ක් වී තිබුණි. මේ නිසා සැළසුම් කර තිබූ පරිදි ආබාධිතයන් පුහුණු කිරීම සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි. | ඉදිකිරීම් කොන්ත්‍රාත් යටතේ ඉදිකිරීම් කලට වේලාවට අවසන්කර ගැනීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතු වීම. | මෙම ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය 2016 දෙසැම්බර් මස ආරම්භ කර 2017 දෙසැම්බර් වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට සැලසුම් කර පැවතියද ආයතනික,නෛතික,පාරිසරික දේශගුණික සාධකයන් මත එම ඉලක්කය වෙත ළඟා වීමට නොහැකි බව දක්වා තිබුණි. |
| (ආ) | මඩකලපුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම 2016 වර්ෂයේ ආරම්භ කර 2017 වර්ෂයේ අවසන් කිරීමට නියමිතවී තිබුණු අතර එහි ඇස්තමේන්තු වටිනාකම රු.100,000,000 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉදිකිරීම සඳහා රු.64,736,228 ක් වියදම් කර තිබුණි. ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී සැලසුම් කර තිබූ ඉදිකිරීම් කොටස් ලංසු කැඳවන අවස්ථාව වන | වෘත්තීමය ලෙස ඇස්තමේන්තු සකස් කිරීම සහ ඒ අනුව ප්‍රතිපාදන සළසාගෙන කාර්යයන් නිමකිරීමට කටයුතු කළ යුතුවීම. | මේ වන විට පළමු අදියර යටතේ (පුහුණු අංශය, පිරිමි නේවාසිකාගාරය හා ගැහැණු නේවාසිකාගාරය) යන අංශ වල ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. ඒ අනුව 2018.03.28 දින එවකට සිටි අමාත්‍යාංශ ලේකම් විසින් මහ භාණ්ඩාගාරය සමඟ කල සාකච්ඡාවට අනුව හිඟ මුදල් 2018 වර්ෂය සඳහා අනුමත මුදලින් ගෙවීම් කරන ලෙසත් ඉතිරි මුදල් වර්ෂ අවසානයේ මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කරන ලෙසත් දන්වා ඇත. ඒ අනුව 2018 වර්ෂය සඳහා වෙන් වූ රු.මි.30 මුදල වියදම් කළ පසු නැවත මහ භාණ්ඩාගාරය සමඟ පැවති සාකච්ඡාවේ දී හිඟ මුදල් ඉල්ලීම් කළද |

| | | | |
|---|---|---|---|
| | විට ඉවත් කර තිබීම, ගොඩනැගිලි සැලසුම් සහ ඇස්තමේන්තු වෙනස්කිරීම, ගිවිසුම් අත්සන් කිරීමේ සහ ඉඩම් අත්පත් කර ගැනීම්වල පැවති ප්‍රමාදයන් හේතුවෙන් ඉදිකිරීම් සැළැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී පළමු අදියර අවසන් කිරීමට නොහැකිවී තිබුණි. | | දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද මුදල් වලින් වැය ශීර්ෂයෙන් මාරු කොට අදාල ගෙවීම් කිරීම සඳහා යොදා ගන්නා ලෙස උපදෙස් දී ඇති අතර ඉතිරි මුදල් 2019 වර්ෂයේ අයවැය මඟින් ලබා දීමට කටයුතු කරන බවත් සහ 2018 වර්ෂයේ පුවක්පිටිය කාන්තා රැකවරණ මධ්‍යස්ථානයට වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් රු.මි.10 ක් මඩකලපුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු වලට මාරු කර තිබුණි .ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි මඩකලපුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා අවශ්‍ය මුදල ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව මෙහි සියළුම වැඩ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2020 අයවැය මඟින් ලබා දීමට නියමිත බව දක්වා තිබුණි. |
| (ඇ) | උතුරු පළාත් තරුණ ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය උදෙසා කිලිනොච්චිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් අදියර දෙකකින් ඉදිකිරීමට 2016 වර්ෂයේදී සැලසුම් කර තිබුණු අතර එහි ඇස්තමේන්තු වටිනාකම රු.64,000,000 ක් වී තිබුණි. 2018 ඔක්තෝබර් මාසයේදී මෙම ඉදිකිරීම් කටයුතු අවසන් විය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.54,375,000 ක් මේ සඳහා වැය කර පළමු අදියර පමණක් නිමකර තිබුණි. | ක්‍රියාත්මක කළ හැකි ඇස්තමේන්තු සකස් කිරීම හා නියමිත පරිදි කොන්ත්‍රාත් කාර්යයන් නිමකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | කිලිනොච්චි වෘත්තීය පුහුණු ආයතනයේ ඉදිකිරීම් නිම කිරීම සඳහා ලබා දුන් ගිවිසුම්ගත කාල සීමාව ඉකුත් වී ඇති බැවින් කාර්ය සාධන සුරක්ෂණය 2018.08.20 සිට 2018.12.19 දක්වා දීර්ඝ කර ඇත. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කිලිනොච්චි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා අවශ්‍ය මුදල ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව කිලිනොච්චිය නව වෘත්තීය පුහුණු ආයතනයේ දෙවන අදියරේ කටයුතු 2020 වර්ෂයේදී ආරම්භ කිරීමට අදාල ප්‍රතිපාදන 2020 අයවැයෙන් ලබා දීමට නියමිතව ඇති බව දක්වා තිබුණි. |

## 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුවක්පිටිය වෘත්තීය පුහුණු ආයතනය නවීකරණය හා ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ රු.50,000,000 ක ප්‍රතිපාදන ලබා දී ඇතත් දෙසැම්බර් 31 දිනට රු.18,914,604 ක් උපයෝජනය නොවී ඉතිරිව පැවතුණි. | ප්‍රතිපාදන ලබා ගැනීමේදී උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | පුවක්පිටිය කාන්තා රැකවරණ මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් එම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබයි.කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන ඔහුට මෙම කාර්යය පවරා දෙන ලදී. නමුත් 2018 වර්ෂය අවසන් වන විට 2018 වර්ෂය සඳහා වෙන්කරන ලද රු.50,000,000.00 ක මුදලට ප්‍රමාණවත් කාර්යයන් ඉටුකළ නොහැකි බව අනාවරණය වීමෙන් පසුව රු.15,000,000/= ක මුදලක් නැවත පවරා ගන්නා ලදී. කෙසේ නමුත් 2019 වර්ෂයේදී ගොඩනැගිල්ලේ සියළු කාර්යයන් අවසන් වීමට නියමිතව ඇති බව දක්වා තිබුණි. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කැටවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ යන්ත්‍ර ශිල්පි පාඨමාලාවේ උපදේශකවරයා 2018 ජූලි මාසයේ ආයතනයෙන් ඉවත්වීම නිසා එම අංශය භාවිතා කරනු ලැබූ උපකරණ අයිතම් 132 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන දිරාපත්වෙමින් පැවතිණි. | ආයතනයේ පුහුණු උපකරණ උපරිම අයුරින් භාවිතා කිරීමට කටයුතු කල යුතුය. | යන්ත්‍ර ශිල්පී අංශයේ උපදේශකවරයා වෙනත් තනතුරකට ගිය බැවින් අදාළ අංශයට උපදේශකවරයෙකු නොමැති විය. ඒ සඳහා තාවකාලිකව කොන්ත්‍රාත් පදනම මත හෝ උපදේශකවරයෙකු බඳවා ගැනීමට උත්සහ කළ අතර අනියම් පදනම මත උපදේශකවරයෙකු බඳවා ගත් ද ඔහුද ලැබෙන දීමනා ප්‍රමාණවත් නොමැති බැවින් අතහැර යන ලදී.කෙසේ වෙතත් උපදේශකවරුන් බඳවා ගන්නා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇති බව දක්වා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමුණුකුඹුර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට අයත් නේවාසිකාගාරයේ ඇඳන් 31 ක් ද, පන්ති කාමරයක් සහ විවේකාගාරය ප්‍රයෝජනය නොගෙන නිශ්කාර්යව පැවතිණි. | ආයතනයේ අවශතාවයන් අනුව සැළසුම් සකස් කළ යුතුය. | ළමුන් ඇතුලත්කර ගැනීමත් සමඟ ඇඳන් 15ක් පමණ ඉතිරිව පවතින බවත් වෘත්තීය උපදේශකවරයෙකු නොමැති වීම හේතුවෙන් පන්ති කාමර 01 ක් හිස්ව පවතී. කෙසේ වෙතත් අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය පුනරුත්ථාපන ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට යෝජනා වී ඇති බැවින් මෙම ප්‍රයෝජනයට නොගෙන ඉතිරිවී ඇති ඉඩකඩ හා භාණ්ඩ ප්‍රයෝජනයට ගැනීමට නියමිත බවද දක්වා තිබුණි |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂය අවසාන වනවිට 75 ක්ව පැවති පුරප්පාඩු සංඛ්‍යාව සමාලෝචිත වර්ෂය අවසාන වන විට 104 දක්වා වැඩිවී තිබුණි. එම පුරප්පාඩු වලින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සඳහා නිලධාරීන් ලබාදෙන ලෙස දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් 2018 දෙසැම්බර් 16 දින ඉල්ලීම් සිදුකර තිබුණද, 2019 මැයි 30 දින දක්වාම එම තනතුරු සඳහා නිලධාරීන් පත්කර නොතිබුණි. | සේවා අවශ්‍යතාවය අනුව බඳවා ගැනීම් සඳහා කටයුතු කළ යුතු වීම. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු අතුරින් 2017.11.25 දින සිට පුරප්පාඩුව පවතින ගණකාධිකාරි තනතුර සඳහා අංක **SSD/**02/02/12/01 හා 2018.11.23 හා 2018.12.10 දිනැති ලිපිය මගින්ද නැවත ගණකාධිකරණ සේවා අංශයෙන් ඉල්ලුම් කරන ලදී. එසේ වුවද අතිරික්ත නිලධාරීන් නොමැති බැවින් බඳවා ගත් පසු ලබා දෙන බවට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 2018.02.05 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. එසේම සහකාර අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු 02 සඳහා අදාල නිලධාරීන් ලබා දෙන ලෙස අංක **SSD/**02/02/12/01 2018.11.23 හා 2019.04.11 දිනැති ලිපි මගින් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව දක්වා තිබුණි. |
| (ආ) | ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 68 න් වෘත්තිය උපදේශකවරු 13 ක්ද, නිවාස පාලක තනතුරු 04 ක්ද සහ සංඥා භාෂා පරිවර්තක තනතුරු 20 ක් බඳවාගැනීමට දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් 2019 | සේවා අවශ්‍යතාවය අනුව බඳවා ගැනීම් සිදුකළ යුතුය. | වෘත්තීය උපදේශක තනතුරෙහි 2018.12.31 දිනට පැවති පුරප්පාඩු 16 අතරින් 2019.01.01 දිනැතිව පුරප්පාඩු 03ක් සම්පූර්ණ කරන ලදී. ඉතිරි පුරප්පාඩු 13 සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සඳහා 2019.04.10 දිනැතිව ලිපියක් ඉදිරිපත් කර ඇති අතර නිවාස පාලක තනතුරෙහි 2018.12.31 දිනට පැවති පුරප්පාඩු 07න් 2019.01.01 |

| | | | |
|---|---|---|---|
| | මාර්තු 19 සහ 2019 අප්‍රේල් 10 දින ඉල්ලීම් සිදුකර තිබුණද, 2019 මැයි 30 දින දක්වාම බඳවා ගැනීම සිදුකර නොතිබුණි. | | දිනැතිව පුරප්පාඩු 04ක් සම්පූර්ණ කරන ලදී. විශ්‍රාම යාම හේතුවෙන් නිවාස පාලක එක් තනතුරක් 2019.02.13 දිනැතිව පුරප්පාඩු වූ අතර තවත් නිවාස පාලක එක් තනතුරක් ඉල්ලා අස්වීම හේතුවෙන් පවතින නිවාස පාලක පුරප්පාඩු සංඛ්‍යාව 05ක් විය. ඒ අනුව එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සඳහා 2019.04.10 දිනැතිව ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති අතර මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැති බවත් සංඥා භාෂා පරිවර්තක තනතුරු 16ක් 2018.04.10 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදී. එසේම 2018.07.18 දිනැතිව **MN** 02-2016 වැටුප් ඛණ්ඩය අනුමත කළ අතර ඒ අනුව සංශෝධිත සංඥා භාෂා පරිවර්තක බඳවා ගැනීම් පරිපාටිය අනුමත කරගැනීම සඳහා 2019.03.19 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. බඳවා ගැනීම් පරිපාටිය සඳහා අනුමැතිය ලද පසු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නියමිත බවත් දක්වා තිබුණි. |
| (ඇ) | කාර්යාල සේවක සේවයේ තනතුරු 10 බඳවා ගැනීම නිර්දේශ සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද එම බඳවා ගැනීම 2019 මැයි 30 දින දක්වාම සිදුකර නොතිබුණි. | සේවා අවශ්‍යතාවය අනුව බඳවා ගැනීම් සිදුකළ යුතු වීම. | කාර්යාල කාර්යය සහායක තනතුරු 10 ක් සඳහා බඳවා ගැනීම් කඩිනමින් සිදුකිරීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බවත් දක්වා තිබුණි. |